# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 22 දරන ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1984 ජූනි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි

තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 22 දරන ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 06 වන දින]

එල්. ඩී.—ඕ. 39/83.

## ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක්, ජීව විද්‍යාවේ සහ එහි සෑම අංශය කටම අයත් පරිචයන්ගේ පොදු උන්නතිය සඳහාත්, ඒ ආයතනයේ සාමාජිකයන් විසින් එකඟ වන ලද අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව, ඒ ආයතනයේ පරමාර්ථ සාර්ථක ලෙස ඉටු කර ගැනීම සඳහාත් මෙතෙක් කල් පිහිටුවා ගෙන තිබුණු හෙයින් ද: පූර්විකාව.

ඒ ආයතනය පිහිටුවන ලද්දේ කවර පරමාර්ථ සහ කාර්ය සඳහා ද ඒ පරමාර්ථ සහ කාර්ය වඩා කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට සහ කර ගෙන යාමට ඊට හැකි වන පරිදි ඒ ආයතනය සංස්ථාගත කරන මෙන් ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1984 අංක 22 දරන ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනයේ දැනට සංස්ථාගත සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සංස්ථාගත සාමාජිකයන්, "ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේය. තවද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනය සංස්ථාගත කිරීම.

**3.** සංස්ථාව සංස්ථාපිත කරනු ලබනුයේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ

(අ) ජීව විද්‍යාව සහ ශ්‍රී ලංකාවෙහි එය අදාළ කිරීම, වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ආ) රටේ ප්‍රගතියට සහ සංවර්ධනයට ජීව විද්‍යාව අදාළ කර ගැනීම හා සම්බන්ධ සියලු කරුණුවල දී රජයට, රාජ්‍ය සංස්ථාවලට, පළාත් පාලන ආයතනවලට සහ වෙනත් ආයතනවලට උපදෙස් දීම;

(ඇ) පහත දැක්වෙන කටයුතු මගින්, එනම්:—

(i) ජීව විද්‍යාව පිළිබඳ නව්‍ය නිවේදන සහ සාකච්ඡා ඉදිරිපත් කිරීම සඳහා මණ්ඩලයක් ඇති කිරීමෙන්;

(ii) පුස්තකාල පිහිටුවීමෙන් සහ පවත්වාගෙන යාමෙන් ;

(iii) ජීව විද්‍යා වෘත්තියට ප්‍රයෝජනවත් වන ප්‍රකාශන පළ කිරීමෙන් ; සහ

(iv) වෙනත් කවර වුවද මාර්ගයකින්

ජීව විද්‍යාත්මක දැනීම් ලබා ගැනීම, පතුරුවා හැරීම සහ අන්‍යොන්‍ය හුවමාරුව යන ඒවා ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) ජීව විද්‍යා අධ්‍යාපනය සියලු මට්ටම්වලින් ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) ජීව විද්‍යාව පිළිබඳව නව්‍ය පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, ඊට ධෛර්යදීම සහ නංවාලීම ;

(ඊ) සාමාජිකත්වයේ විවිධ ශ්‍රේණිවලට ඇතුළත් කර ගැනීම සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් තක්සේරු කිරීම ;

(උ) ආයතනයේ සාමාජිකත්වයේ සියලු ශ්‍රේණි සඳහා සුදුසුකම් ලබා ගැනීමේ විභාග පැවැත්වීම හෝ පැවැත්වීමට කටයුතු සම්පාදනය කිරීම සහ ඒ විභාග සඳහා අධ්‍යයන පාඨමාලා ප්‍රවර්ධනය කිරීම, සැපයීම හෝ අනුමත කිරීම ;

(ඌ) ආයතනයේ සාමාජිකයන්ගේ වෘත්තීය කටයුතුවල දී සහ සාමාන්‍ය පැවැත්මේ දී උසස් තත්ත්වයක් පවත්වාගෙන යාමට වගබලා ගැනීම ;

(එ) වෙනත් විද්‍යා සංවිධාන සමඟ සම්බන්ධතා ඇති කර ගැනීම ;

(ඒ) ශ්‍රී ලංකාවේ ජීව විද්‍යා වෘත්තියේ තත්ත්වය නංවාලීම ; සහ

(ඔ) සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන වෙනත් කවර වුවද පියවරක් ගැනීම.

*සංස්ථාවේ සාමාන්‍ය බලතල.*

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනවල යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය සේවක පිරිස සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටු කර ගැනීම සඳහා හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටුකිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

*සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.*

5. (1) සංස්ථාවේ අතුරු ව්‍යවස්ථාවලට යටත් ව, සංස්ථාවේ කටයුතු සංස්ථාවේ නිලධරයන්ගෙන් ද අතුරු ව්‍යවස්ථාවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ ඒ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සෙසු තැනැත්තන්ගෙන් ද සමන්විත වූ සභාවක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන අවස්ථාවේ දී ආයතනයේ නිල දූරු සභාව සංස්ථාවේ ප්‍රථම සභාව විය යුතු ය.

සංස්ථාවේ අතුරු ව්‍යවස්ථා.

6. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා සංස්ථාව විසින්, කලින් කල, යම් සාමාන්‍ය මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන අතුරු ව්‍යවස්ථා සෑදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. එකී අතුරු ව්‍යවස්ථා සෑදීමෙන් පසු එවැනි ම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ඒ අතුරු ව්‍යවස්ථා වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම ද කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයෝ සෑමවිට ම සංස්ථාවේ අතුරු ව්‍යවස්ථාවලට යටත් විය යුත්තාහ.

දේපළ අත්කර ගැනීමට සහ මුදල් ලබා ගැනීමට ඇති බලය.

7. (1) මිලට ගැනීමෙන්, ත්‍යාග වශයෙන්, අන්තිම කැමති පත්‍රයකින් හිමිකර දීමෙන්, රික්ථවරණය කිරීමෙන්, හුවමාරු කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් නිශ්චල හෝ චංචල දේපළ අත්කර ගැනීමේ සහ දැරීමේ ද එසේ අත්කර ගන්නා ලද හෝ දරන හෝ දේපළ නියාදනය කිරීමේ ද බලය නීතියෙන් සංස්ථාවට ඇත්තේ ය.

(2) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට සංස්ථාවට බලය ඇති අතර, එසේ මුදල් ලබා ගැනීම සඳහා උකස්කර, බැඳුම්කර හෝ ණය කර ඇතිකිරීමේ, ලියා අත්සන් කිරීමේ, ප්‍රදානය කිරීමේ සහ නිකුත් කිරීමේ බලය ද සංස්ථාවට ඇත්තේ ය.

(3) මේ පනත යටතේ හෝ සංස්ථාවේ අතුරු ව්‍යවස්ථා යටතේ සංස්ථාව විසින් අත්කර ගන්නා ලද හෝ දරනු ලබන චංචල හා නිශ්චල සියලු දේපළ සහ සංස්ථාවට ගෙවනු ලබන හෝ සංස්ථාවට ලැබෙන සියලු මුදල්, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා සංස්ථාවේ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව, සංස්ථාව විසින් දැරිය යුතු, පරිහරණය කළ යුතු සහ යෙදිය යුතු අතර, එකී අතුරු ව්‍යවස්ථාවලට යටත්ව, ඒ දේපළ අතරින් කිසිවක්, සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන හෝ උචිත වන ආකාරයට කලින් කල, මිලට ගැනීමේ, විකිණීමේ, ප්‍රදානය කිරීමේ, පවරා දීමේ, රික්ථවරණය කිරීමේ, පැවරීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ආකාරයකින් නියාදනය කිරීමේ හෝ උකස් කිරීමේ බලය ද සංස්ථාවේ අරමුදල් එකී පරිදි අයෝජනය කිරීමේ බලය ද සංස්ථාවට ඇත්තේ ය.

ගාස්තු සහ දායක මුදල් අය කිරීමේ බලය.

8. සංස්ථාව විසින් පහත දැක්වෙන මුදල් අය කරනු ලැබිය හැකි අතර ඒ සඳහා බලය සංස්ථාවට ඇත්තේ ය:—

(අ) සංස්ථාව විසින් පවත්වා ගෙන යනු ලබන යම් පාඨ මාලාවකට හෝ විභාගයකට අපේක්ෂකයන් ඇතුළත් කර ගැනීම සඳහා යුක්ති සහගත යයි සංස්ථාව විසින් සලකනු ලබන ගාස්තු ;

(ආ) සංස්ථාවේ යම් සාමාජික පන්තියකට සුදුසු තැනැත්තන් තෝරා පත් කර ගැනීම සඳහා වූ ගාස්තු; සහ

(ඇ) සංස්ථාව විසින් සපයනු ලබන සේවා සඳහා අය කිරීමට යුක්ති සහගත යයි සංස්ථාව විසින් සලකනු ලබන දායක මුදල් සහ ගාස්තු.

ආයතනය විසින් ගෙවිය යුතු හා ආයතනයට අයවිය යුතු ණය.

**9.** මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී ආයතනයෙහි පවත්නා සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු හෝ බේරුම් කරනු ලැබිය යුතු අතර ආයතනයට අයවිය යුතු සියලුම ණය සහ ආයතනය වෙත ගෙවිය යුතු සියලු දායක මුදල් සහ ගාස්තු මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

කමිටු පත් කිරීම.

**10.** යම් කමිටුවක් පත් කිරීමේ බලය සංස්ථාවට ඇති අතර, ජීව විද්‍යාඥයන් වශයෙන් ශ්‍රී ලංකාවේ වෘත්තියේ යෙදී සිටින හෝ ක්‍රියා කරන තැනැත්තන් අතර වෘත්තීය සම්මතයන් හා විනය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වෙනත් පියවර කලින් කල ගැනීමේ බලය ද සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේද යන වග.

**11.** සභාව විසින්, කලින් කල, ස්ථාවර නියෝග මගින් බලය පවරනු ලබන තැනැත්තන් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතබනු ලැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා, ඒවා ලබාගත හැකිය.